# දැන්වීමයි

## මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

# රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ සංචාරක බංගලා භාරකරු තනතුරට බඳවා ගැනීම

රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ සංචාරක බංගලා භාරකරු තනතුරේ පවතින පුරප්පාඩු 01 ක් සඳහා විවෘත පදනම මත පිරවීම සඳහා, පහත සඳහන් සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ.

**(අ) අයදුම්පත් කැඳවන අවසාන දිනය 2026.04.23 දින වේ.**

සටහන: ඉල්ලුම්පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපැලේදී නැතිවූ බවට හෝ ප්‍රමාදවූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය.

**01. සේවයට බඳවා ගැනීමේ ක්‍රමවේදය**

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති සියළු අයදුම්කරුවන් අතුරින්, මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත වඩාත් සුදුසු අපේක්ෂකයෙකු පවතින පුරප්පාඩුව (01) සඳහා බඳවා ගනු ලැබේ.

පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයකට නොඅඩු අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන නිලධාරින් සංඛ්‍යාවක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී සිදු කරනු ලැබේ

**02. සුදුසුකම්**

i. සිංහලෙන් හෝ දෙමළෙන් හෝ ඉංග්‍රීසියෙන් හෝ යටත් පිරිසෙයින් 8 වෙනි පන්තිය හෝ ඊට ඉහළ විභාගයකින් සමත්ව තිබීම.

ii. වෙනත් භාෂාවන් පිළිබඳව දැනීම අතිරේක සුදුසුකමක් ලෙස සැලකේ.

iii. සෑම අයදුම්කරුවෙකුම පෙරදිග සහ අපරදිග ක්‍රම දෙකේම කෑම පිසීමේ මනා දැනුමක් තිබිය යුතුය.

iv. නානායම්වල හෝ වෙනත් ස්ථානයන්හි ආහාරපාන සැපයීම් පිළිබඳව ලබා ඇති පළපුරුද්ද මුළුතැන් ගෙවල්වල හා නානායම්වල සනීපාරක්ෂාව හා නියම අන්දමින් අමුත්තන් පිළිගැනීම පිළිබඳ මනා දැනීමක් තිබෙන අයදුම්කරුවන් පිළිබඳව විශේෂයෙන් සලකනු ලැබේ.

v. පිළිගත් බාහිර ආයතනයක සමාන තත්ත්වයේ තනතුරක අවම වශයෙන් අවුරුදු 03ක පළපුරුද්ද ලබා තිබිය යුතුය.

vi. සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට මනා ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

vii. සියළු අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු අතර, විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

**03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි**

i. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

ii. මෙම පත්වීම තුන් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත්ය.

iii. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි සඳහන් විධිවිධාන හා ඊට අනුශාංගික චක්‍රලේඛවල විධිවිධාන අනුව අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

iv. මෙම පත්වීම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති, මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහයේ විධිවිධාන, දෙපාර්තමේන්තු නියෝග, රජය මගින් නිකුත්කර ඇති හා නිකුත් කරනු ලබන නියෝග වලට යටත් වේ.

**04. වයස් සීමාව**

අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

**05. වැටුප් පරිමාණය**

2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 දරන වැටුප් චක්‍රලේඛයට අනුව මෙම පත්වීමට හිමි මාසික වැටුප් පරිමාණය රු. 40,000-10X450-10X490-10X540-12X590-61,880 (PL-1-2025) වේ.

**06. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය:**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී සියලුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය. පසුව ඉදිරිපත් කරනු ලබන ලේඛනවලට ලකුණු ලබා දෙනු නොලැබේ.

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

i. පුද්ගලයින් ලියාපදිංචිකිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත

ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය

**07. අයදුම්පත් ඉදිරිපත් කිරීම:-**

i. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් මෙම නිවේදනය අවසානයට දක්වා ඇති ආදර්ශ අයදුම්පත් ආකෘතිය අනුව අයදුම්පත සම්පූර්ණ කර 2026.04.23 දිනට ප්‍රථම මා වෙත ලියාපදිංචි තැපැලෙන් ලැබෙන සේ ඉදිරිපත් කළ යුතුය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ii. රජයේ අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක සේවයේ නියුතු අපේක්ෂකයෙකු නම්, දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම්පත සම්පූර්ණ කර 2026.04.23 දිනට ලියාපදිංචි තැපැලෙන් ලැබෙන සේ ඉදිරිපත් කළ යුතුය.

iii. මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

**08. සාවද්‍ය තොරතුරු සැපයීම:-**

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව ඕනෑම අවස්ථාවක සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ල පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව සතුවේ.

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ නියෝගය පරිදි

**රජයේ ප්‍රධාන තක්සේරුකරු,**
**රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව.**